# උඩඟු හිවලා



රෑට සොරකම් කරන්නට පුරුදු හිවලෙක් සිටියා. ඌ ගෙවල්වලට ගොස් හොරා කෑවා. එක් රැයක මේ හිවලා නිල් සායම් හැළියකට ඔළුව දැම්මා. හැළියේ කට පුංචියි. ඌ බොහොම වෑයම් කර ඔළුව පිටතට ගත්තා. එවිට එහෙම පිටින් ම උගේ ඔළුව නිල් පාට වී තිබුණා.

ඔළුව විතරක් නෙමෙයි සායම් ඇඟ පුරාම ගෑවනු බව හිවලා දැන ගෙන හිටියෙ නැහැ.



මේ වෙනස නොදත් අපූරු හිවලා

සුපුරුදු ලෙස කැලයට ගියා. කැලේ සත්තු හිවලා දැක පුදුම වී, "මූ උතුම් සතෙකැ" යි සිතා, උන්ගේ රජ කමට තෝරාගත්තා.



එයින් ආඩම්බර වුණු හිවලා උගේ නෑයන්ගෙන් වෙන් වී වාසය කළා. හිවලුන්ගේ කෑගැසීම නිසා ඒ කැලෑවේ සිටින අනෙක් සතුන්ට කරදර ඇති වුණා. ඒ නිසා සේරම සත්තු එකතු වී හිවලුන්ගේ කෑ ගැසීම නැවැත්වීමට ඔවුන්ගේ රජ්ජුරුවන් පිටත් කර හැරියා.



හිවලුන්ගේ හූ කීම ඇසෙන විට රජතුමාත් පුරුදු හඬින් කෑගැසුවා. තමන් රජ කමට පත් කරගෙන ඇත්තේ හිවලකු බව දැනගත් ඒ කැලේ සත්තු ඌ රජ කමෙන් පන්නා දැම්මා.